රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : **04/2003**

මගේ අංකය:ආ/XTU/21/XLV
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**2003.11.18** දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය නිලධාරීන් සඳහා වන අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය</u>

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග මෙම අමාත්‍යාංශය පවත්වන ලද සාකච්ඡාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මෙතෙක් ක්‍රියාත්මකව පැවති ආකාරයටම **2003** වර්ෂය සඳහා ද අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමට සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එකඟ වී ඇති බව ඔබ වෙත දන්වීමට කැමැත්තෙමි.

**02.** **2003** වර්ෂයට අදාළ හිමිකම් ඉල්ලීම් **2004.01.31** දිනට පෙර සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අදාළ කාර්යාල වෙත ඉදිරිපත් කිරීමට ඔබ ආයතනයේ සිටින සියළුම අග්‍රහාර රක්ෂිතයන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**03.** මෙම ලිපිය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එකඟතාවය සහිතව නිකුත් කරන ලදී.

**04.** **2004.01.31** දිනෙන් පසු ඉදිරිපත් කරනු ලබන හිමිකම් ඉල්ලුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබේ.



එස්.සී.මාන්නප්පෙරුම
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ
සහ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

<u>පිටපත්</u>:

1. ලේකම්
   මුදල් අමාත්‍යාංශය - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා

2. සභාපති
   සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා